# පුංචි සුමුදු



කතෘගේ නම

එස්.එම්. ජේනුලි යුහන්සා බංඩාර

# පුංචි සුමුදු



කතෘගේ නම

එස්.එම්. ජේනුලි යුහන්සා බංඩාර

# පුංචි සුමුදු

කතාව සහ චිත්‍ර
එස්.එම්. ජේනුලි යුහන්සා බංඩාර
කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2025 පෙබරවාරි 08

ISBN No : 978-624-208-525-8

1 ශ්‍රේණිය E
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# පිදුම

නිති දැනුමෙන් පෝෂණය කරන්නට
වෙර දරන, මාගේ සදාදරණීය
විදුහල්පතිතුමිය, පන්තිභාර ගුරුතුමිය,
ඇතුළු ගුරු මව්පියවරුන්ටත්,
මා පෝෂණය කරන ඇති දැඩි කරන
මාගේ ආදරණීය දෙමාපියන්ටද,
සහෝදර, සහෝදරියන්ටද,
මාගේ මිතුර මිතුරියන් සියළු දෙනාටම මෙම
පොත ආදර ගෞරවයෙන්
යුක්තව පුද කරමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.
ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණී"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.
මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.



එකොමත් එක ගමක පුංචි ලස්සන ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම තමයි සුමුදු, සුමුදු හරිම ලස්සනයි, අහිංසකයි, හැඩයි. සුමුදු ජීවත් වුණේ එයාගේ කුඩම්මාත් එක්ක. කුඩම්මා හරිම නපුරුයි.

ගෙදර හැම වැඩක්ම කුඩම්මා කරගත්තේ පුංචි සුමුදුට කියලා. එත් කොච්චර හොඳට වැඩ කරත් පුංචි සුමුදුට වුණේ කුඩම්මාගෙන් ගුටි කන්න.



එක දවසක් වළං හෝදමින් ඉද්දි සුමුදු අතින් වළඳක් බිඳුණා. මේක දැකපු කුඩම්මාට හොඳටම තරහා ගිහින් සුමුදුට හොඳටම ගුටි දුන්නා. එදා දවස සුමුදුට කෑම දුන්නෙත් නැහැ.





ටිකෙන් ටික රෑ වුණා
ඒත් කුඩම්මා සුමුදු ව
ගෙදර ඇතුළට ගත්තේ
නැහැ. සුමුදු අඬමින්
මිදුලට වෙලා හිටියා.

එකපාරටම ලස්සනම ලස්සන පුංචි සුරංගනවියක් සමුදු ළඟට ආවා සමුදු පුදුම වුණා.



“අඬන්න එපා සුමුදු, මම ආවේ ඔයාට උදව් කරන්න. මම හැමදේම බලාගෙන හිටියේ.”

සුරංගනාවී සුමුදුගේ හිස අතගාමින් කිව්වා.

“මට හොඳටම බඩගිනියි.” සුමුදු කිව්වා.

“ ඉන්නකෝ මං ඔයාට රස කෑම දෙන්නම්.”


කියු සුරංගනාවී සුමුදු ආසම කෑම ගොඩක් සුමුදුට දුන්නා.


“මෙච්චර රස කෑම මටද ? ”

සුමුදු ඇහුවා.

“ඔව් පැටියෝ” මේ ඔක්කොම ඔයාට”

සුමුදු ආසාවෙන් කෑම ඔක්කොම කෑවා.





සුමුදු මිට පස්සේ ඔයා අඬන්න ඕන නැහැ. මම ඔයාට උදව් කරන්නම්. සුරංගනාවී කිව්වා එදා ඉදන් ගෙදර වැඩ වලට සුරංගනාවී සුමුදුට උදව් කරා. එත් කුඩම්මාගේ නපුරු ගති නම් අඩු වුණේ නැහැ. සුරංගනාවී ළඟ ඉන්න නිසා වෙනදා වගේ සුමුදු ඇඬුවේ නම් නැහැ.

ටිකෙන් ටික සුමුදු ලොකු වුණා. කුඩම්මා වයසට ගිහින් ලෙඩ වුණා. ලෙඩ ඇඳේ හිටපු කුඩම්මාට සුමුදු ආදරෙන් සැළකුවා.

"සුමුදු , දුවේ මට සමාවෙන්න.
මම උඹට ගොඩක් වෙනස්කම් කරා. ඒ
හැමදේටම මට සමාවෙන්න මගේ දුවේ.
කුඩම්මා අඬමින් සුමුදුගෙන් සමාව ඉල්ලුවා.
"සමාව ඉල්ලන්න ඕනේ නැහැ කුඩම්මේ,
කුඩම්මා මට ආදරේ කරේ නැති වුණාට මගේ
ආරක්ෂාවට මගේ ළඟින් හිටියානේ. මට ඒ
ඇති."
සුමුදු කුඩම්මාගේ ඔළුව අතගාමින් කිව්වා.
"ඒ වුණාට මට සමාවෙන්න දුවේ, මම පුළුවන්
තරම් වද හිංසා කරාට."
කුඩම්මා සුමුදුගේ අත්දෙකම තදින් අල්ලාගෙන
ම ඇස් පියාගත්තා.


Mat

සුමුදු හොඳටම ඇඩුවා. සුරංගනාවී සුමුදු ළඟින්ම ඉදන් සුමුදු ව සැනසෙව්වා.
"සුමුදු අඬන්න එපා. අපි කරන දෙය තමයි අපිට ආපහු ලැබෙන්නෙ.
අපි හොඳ දෙයක් කරොත්, අපිට හොඳක් වෙනවා.
අපි නරක වැඩ කරොත්, එත් අපිට කවදාහරි පසුතැවෙන්න වෙනවා. ඒ නිසා අපි හැමදාම හොඳ දේවල්ම කරන්න පුරුදු වෙන්න ඕනේ."
සුරංගනාවී සුමුදුගේ හිස අතගාමින් කිව්වා.

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දි තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්